# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2482/04 - 2026 මාර්තු මස 30 වැනි සඳුදා - 2026.03.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 7/2023

**2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත**

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය සමග කියවිය යුතු එකී පනතේ 156 වන වගන්තිය යටතේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විමසා, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

හර්ෂණ නානායක්කාර,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය.

2026 මාර්තු මස 30 වන දින,
කොළඹ දී ය.

නියෝග

**1.** මේ නියෝග 2026 අංක 01 දරන දූෂණ විරෝධී (වත්කම් හා බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමට නියමිත අධිඅවදානම් කාණ්ඩ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය ප්‍රකාරව, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නිලධාරි කාණ්ඩයන් අධිඅවදානම් කාණ්ඩ වශයෙන් නම් කරනු ලැබේ.

**උපලේඛන**

(2 වන නියෝග)

නිලධාරි කාණ්ඩයන්

1. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 115 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී රේගු අනුයෝජිතයන්.

EOG 03 - 0261

1A - G 46555 — 04 (2026/03)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*